**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - 2018**

-------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙනයාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

--------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍යවේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 57 වගන්තිය ප්‍රකාරව හා සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව ජංගම නොවන වත්කම් භාවිතයට ගත හැකි දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 12 දින ජපන් රජයෙන් පරිත්‍යාග වශයෙන් ලද වටිනාකම රු.15,000,000 ක රියදුරු පුහුණු උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර එයට අදාළ රු. 97,603 ක ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට හා ගිණුම් නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර බිල්පත් සඳහා පෙර වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 4,128,270 ක පොළී ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව පෙර වර්ෂයේ අතිරික්තයට ගැලපීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඇස්තමේන්තු අගයන් මත ගිණුම් තැබීම නිසා මෙවැනි තත්ත්වයක් උද්ගත වී ඇති බව. | පෙර වර්ෂයට අදාළව ලැබී තිබුණු පොළී ආදායම අතීතානුයෝගීව පෙර වර්ෂයේ අතිරික්තයට ගැලපීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුහුණත වටිනාකම රු. 104,742 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ගිණුම් ගත කර නොතිබුණි. | අදාළ ලේඛන නිවැරදි කරන බව. | ගණුදෙණු නිවැරදිව සටහන් වන බවට වග බලා ගත යුතුය. |

**1.6 නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය. | මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර අයවැය ලේඛනය වර්ෂය ආරම්භවීමට පෙර අනුමත කර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 754 | 2018 වර්ෂයේ ඉන්වෙන්ට්‍රි ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි 754 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය. | ආයතනයේ සභා රැස්වීම් වලදී කාර්යසාධනය පිළිබඳව ඇගයීමක් කළ යුතු වුවද, පවත්වන ලද සභා රැස්වීම් වලදී එපරිදි ක්‍රියාකර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර ඇති බව හා ඉදිරියේ දී පාලක සභාවට ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඈ) වගන්තිය. | සභාවේ සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය, භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2005 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාව ආරම්භයේ සිටම කිසිදු වර්ෂයක් සඳහා වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි. | 2017/2018 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා සැකසීමට උපදෙස් ලබා දී ඇති බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | පාලක මණ්ඩලයක් පත් කර නොතිබීම හේතුවෙන් විගණන කමිටුවට සාමාජිකයන් පත්කර ගැනීමට නොහැකිවීම නිසා රැස්වීම පැවත්වීමට නොහැකි වූ බවත් 2019 වසරේ සිට නිසි ආකාරයෙන් රැස්වීම් පවත්වන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 52,006,537 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 44,959,713 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,046,824 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රචාරණ වියදම් සියයට 85 කින් අඩුවීමත්, වන්දි ගෙවීම් සියයට 36 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා වසර 21 ක් ගත වී ඇතත් 1998 අංක 05 දරන පනතින් (සංශෝධිත) මෝටර් වාහන පනතේ දැක්වෙන ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යයන් වන, සෑම වසරකම මාර්ග ජාලයට අලුතින් එකතු වන මාර්ග සම්බන්ධව හා රථ වාහන ප්‍රමාණය මාර්ග අනතුරු, දේපල හානි හා සම්බන්ධ සියළු තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, පර්යේෂණ පැවැත්වීම, ක්ෂේත්‍ර පරීක්ෂණ පැවත්වීම සහ ආධාර කිරීම, මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් දීම, මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබාදීම හා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යය සම්බන්ධීකරණය කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. | මෙම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කරන බව. | සභාවේ අරමුණු ඉටුකර ගත හැකි වන පරිදි කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ වින්දිතයින්ට වන්දි වශයෙන් රු. 8,200,000 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු. 5,200,000 ක් වශයෙන් අඩු වී තිබුණි. අයදුම්පත්‍රවල පවත්නා අඩුපාඩු හේතුවෙන් සහා අනුමැතිය හා ස්ථාවර කමිටු අනුමැතිය ලබාදීමේ ප්‍රමාදය ගෙවීම් අඩුවීමට හේතු වී තිබුණි. | අයදුම්පත්‍රය සමඟ ලියවිලි සම්පූර්ණ වී ඇත්නම් නියමිත ක්‍රියාපටිපාටියට අනුව ප්‍රමාදයකින් තොරව වන්දි ගෙවීම් සිදු කරන බව. | අප්‍රමාදව වන්දි ගෙවීම සඳහා පියවර ගත යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂමක් බවට පත් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම, 2010 වර්ෂයේ සිටම සැලැසුම් කර තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදී ද අවසන් කර නොතිබුණි. | 2019 ජූනි 10 වන විට කැබිනට් පත්‍රිකාව සකස් කර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බව. | සැලැසුම් කරන ලද කාර්යයන් කඩිනමින් ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | මාර්ග අනතුරු පිළිබඳ දත්ත විග්‍රහයන්ට අනුව සමාලෝචිත වර්ෂයේ දුම්රිය අනතුරු සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව, මාරක අනතුරු සංඛ්‍යාව 25 කින්ද, බරපතල අනතුරු සංඛ්‍යාව 331 කින්ද වර්ධනය වී තිබුණු අතර දුම්රිය හරස් මාර්ගවල සිදු වූ අනතුරු සංඛ්‍යාවද 181 කින් වර්ධනය වී තිබුණි. මෙම අනතුරු වැළක්වීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සැලැසුම් කළ පියවරවලින් ක්‍රියාත්මක කර තිබුණේ සියයට 2.8 ක් පමණි. ඒ අනුව සභාව පිහිටුවීමේ සමාජ වගකීම නිසියාකාරව ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | වාර්ෂිකව මාර්ගය භාවිතා කරන මගීන්ගේ ප්‍රමාණය හා භාවිතා කරන වාහන වල ප්‍රමාණය ඉහලයාම සලකා බලන විට ප්‍රතිශතයක් ලෙස ගත් කළ අනතුරු වල අඩුවීමක් හඳුනාගත හැකිබව. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවීමේ අරමුණු ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |

## 3.3 අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 66 ක ආදායම් උපයාගෙන තිබුණ ද සභාවේ ඉටුකළ යුතු කාර්යයන් සඳහා ඉන් රු. මිලියන 14 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ආයෝජන අනුපාතය වාර්ෂිකව ඉහල මට්ටමක පැවතිය ද සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම මුදල් යොදවා නොමැති බව නිරීක්ෂණය විය. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ඉදිරියේ දී කොමිෂන් සභාවක් බවට පත් වූ පසු එහි කළමනාකරණ කටයුතු මැනවින් ඉටු කර ගැනීම සඳහා දැනට පවත්නා දෛනික වියදම් අවම මට්ටමක පවත්වාගෙන ඇති බවත් අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇති බව. | මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවීමේ පනතේ අරමුණු ඉටු කිරීම සඳහා අරමුදල් යෙදවිය යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමණාකරනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2019 ජුනි 10 වන විට පිළියෙල කර ඇති බව. | මුදල් වර්ෂය ආරම්භවීමට පෙර ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 ඡේදය අනුව රු. 200,000 කට වැඩි වාහන අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් නිල වාහනයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු. 821,593 ක වියදම් සඳහා එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | සංචිත වාහන ලබාගෙන ඇත්තේ අමාත්‍යාංශයෙන් වන බවත්, අළුත්වැඩියා කටයුතු අමාත්‍යාංශය හරහා සිදුවන බැවින් විශේෂ අනුමැතියක් අවශ්‍ය නොවන බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ යුතු අතර, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම/ප්‍රතිඵල දැක්විය යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත නොවූ අයවැය ඇස්තමේන්තු පදනම් කරගෙන පිළියෙල කර තිබුණු අතර, ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵලද දක්වා නොතිබුණි. | 2018 වසරේ එවැනි අඩුපාඩු පිළිගන්නා බවත් ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2005 වර්ෂයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණු පාදක කරගෙන 2010 – 2017 කාල පරාසයට අදාළ හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම කාර්යසාධන නිර්ණායකයක් ලෙස ජාතික මට්ටමේ ක්‍රියාත්මක වන පුහුණු කිරීමේ නිවාරණ කාර්යයන් සම්බන්ධ දැනුවත් කිරීමේ ව්‍යාපෘති රාශියක් හැඳිනගෙන තිබුණ ද ඒ ඒ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් මූලිකවම හඳුනාගෙන නොතිබීම නිසා වැඩසටහන්වල ඵලදායීතාවය අවම මට්ටමක පැවතුණි. | 2019 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති කාර්යයන් වර්ෂය තුල ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. |